# සිඟිති හොඳ ළමයෙක්



ජේ.ජේ.පී. ක්‍රිත්වී ගන්ධාරා ජයරත්න

# සිහිනි හොඳ ළමයෙක්.

## ජේ.ජේ.පී. ක්‍රිත්වී ගන්ධාරා ජයරත්න


චිත්‍ර සහ කතෘගේ නම - ජේ.ජේ.පී. ක්‍රිත්වී ගන්ධාරා ජයරත්න

**ISBN - 978-624-206-851-0**

ප්‍රකාශිත දිනය - **2023 දෙසැම්බර් 05**

# පිදුම..

මගේ ආදරණීය
ගුරුවරුන්ට,
දෙමාපියන්ට,
වැඩිහිටියන්ට සහ
සහෝදර
සහෝදරියන්ට මම
මෙම පොත පුදමි...

## <u>පෙරවදන</u>

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීමේ ගොඩනැගීමේ අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතාව හඳුනාගෙන ඒවා ඔපවත් කිරිම තුලින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබු සුවිශේෂ ජයක්ග්‍රහණයක් මෙන්ම කාලින ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකී.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙහෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යයාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්න නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

මෙයට

සෙනවිරත්න මහලේඛම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක


සිහිනි බලු පැටියාට හරිම ආදරෙයි. උෟට බත්,මස්, මාළු සහ හාල්මැස්සෝ දුන්නාය.

උගේ කොණ්ඩෙ මයිල් පීරා නැවුවාය.





සිඟිත්ට ලස්සන මල් වත්තක් තිබුණා. ඒ මල් හරිම සුවඳයි, ඒ වගේම හරිම ලස්සනයි.



සිහිනි බලු පැටියාට වගේම මල් වත්තටත් ආදරෙයි. ඇය බලු පැටියා හොඳින් බලාගත්තාය.

ඇය බලු පැටියාට, මල් වත්තට සහ අනික් සතුන්ටද නවාතැන් සාදා දුන්නාය.



සිඟිත්ට එහා ගෙදර රෝසි කියලා යෙහෙළියක් හිටියා .

ඇය හරිම නපුරු, අකාරුණික ළමයෙක්. සතුන්ගේ නවාතැන් කඩා මල් පැල පොඩි කලාය.





එක සතෙක්වත් ඇයගේ කාමරයට හෝ ගෙදරට ආවේ නෑ. ඇය සතුන් එළවනවා.

එක දවසක් සිඟිති කුරුල්ලන්ට ඉන්න වෙනම ගෙයක් සාදා දුන්නාය.

රෝසි ඒ කුරුළු ගෙදර කැඩීමට උත්සහ කලාය.



ඒ බව දුටු සිඟිති ඉක්මනින් රෝසි ළඟට ගොස් හැම දෙනා සමඟම සමගියෙන් ජීවත් වීමේ අගය කියා දුන්නාය.



ඉන් පසු රෝසිද, සිඟිතිගෙන් හොඳ දේ ඉගෙන ගෙන හොඳ දරුවෙක් විය.

නිමි!

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සහාත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී.ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබාගන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක් ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවකට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම් කරුවන් ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතුවරයෙක් වීමට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.